33 පිටෙන්

සෞඛ්‍යයට එය ඉතා අහිත කර විය. ඇය පැවසුවේ බොහෝ විෂබීජ මේ මගින් දරුවාට ශරීර ගතවිය හැකි බවයි. කෙසේ නමුත් නලලේ තිලකය නම් සෑහෙන කාලයක් යනතුරුම තැබීමට අප උනන්දු වූයේ එමගින් මගේ දියණියගේ මුහුණට අමුතු ඔපයක් වැටෙතැයි අපට සිතුන නිසාය.

පසුගිය දෙසැම්බරයේ අපි ලංකාවට ගිය අවස්ථාවේ සිදුවූ යමක් මේ අවස්ථාවේ නොකියාම බැරිය. ලංකාවේ ගොඩ නැගෙමින් පවතින නිවසක් අසල, පඹයෙක් හෝ පුහුල් ගෙඩියක් එල්ලා තැබීම සුලභ දසුනකි. එසේ කරන්නේ ඇස්වහ කටවහ දෝෂවලට එම නිවස එක එල්ලේ ලක්වීම වලක්වනු පිනිසය. මගේ නව හැවිරිදි දියණියටත්, සය හැවිරිදි පුතනුවන්ටත් මෙම පඹයා සහ පුහුල් ගෙඩිය මහත් ප්‍රහේලිකා-වක්ව තිබු බව දිනක් ඔවුන් මගෙන් ඇසූ ප්‍රශ්නවලින් මට පසක් විය. මගේ පුතාට අනුව නම් පඹයා ගෙවල් ගාව නොව, ගොවිපලක කුරුල්ලන් බය කිරීම සඳහා තිබිය යුත්තකි. මුලින්ම මෙම එල්ලා ඇති ගෙඩිය කුමක්දැයි ඇසු දියණිය, එය පුහුල් ගෙඩියක් බව දැනගත් පසු එය ආහා-ාරයට නොගෙන මෙලෙස තැබීමෙන් නාස්තියක් වන බව පැවසීය. ඉන්පසු මම, මගේ දරු දෙදෙනාට ඉතා සරල ලෙස මේ පඹයා සහ පුහුල් ගෙඩිය ගෙවල් ඉදිරිපිට එල්ලා තැබීමේ අරමුණ පැහැදිලි කර දුන්නෙමි.

ඉන්පසු මගේ දියණිය මම කිසිසේත් බලාපොරොත්තු නොවූ අදහසක් ඉදිරිපත් කළාය. 'අම්මේ ඕස්ට්‍රේලියාවෙත් හරියට අළුත් ගෙවල් හදනවනෙ. එහෙත් පඹයෝ, පුහුල් ගෙඩි එහෙම එල්ලුවොත්, අපිට ලංකාවෙන් ඒවා ගෙනියන්න පුළුවනිනෙ'' ඒ අවස්ථාවේ ''පිස්සුද ළමයෝ'' යි ඇගේ අදහස බැහැර කලත් දැන් දැන් මටත් එය හොඳ අදහසකැයි සිතේ. යුරෝපා ජාතිකයන් අතර මෙම පුරුද්ද ඇති කලහොත් ලංකාවේ වියළි කලාපයේ ගොවියාගේ පුහුල් අස්වැන්නට හොඳ මිලක් ලබාදීමටත්, ජනකලා කේන්ද්‍රය වැනි ආයතනයක් හරහා ඉතා උසස් තත්ත්වයේ, කලාත්මක අයුරින් නිම කරන ලද පඹයන් ගෙන්වීමේ ව්‍යාපාරයක් ආරම්භ කර ලංකාවේ තරුණ, තරුණියන් කිහිපපලකට හෝ රැකියා ලබාදීමේ පුන්‍ය කර්මයක් ද ඒ මගින් කර ගත හැකි වනවා නො-අනුමානය.

# ජපන් රස කතා



## ජපන් සෙන් කතා

### භාවනාව හා අධිෂ්ඨානය

ඈත අතීතයේ මෙයිපි යුගයේ ඕ නමි යනුවෙන් හැඳින්වුනු ප්‍රසිද්ධ මල්ලව පොර ශූරයෙක් සිටියේය. මහා දිය රැ ළි යනු ඔහුගේ නමේ තේරුමයි. ඔහු ඉතා ශක්තිමත් එමෙන්ම මල්ලව පොර කලාව ඉතා දක්ෂ ලෙස ප්‍රගුණ කළ අයෙකු විය. ඔහු අභ්‍යාසයේ යෙදෙන විට සිය ගුරුවරයා පවා පරදවන නමුත් ප්‍රසිද්ධියේ තරඟ වදින අවස්ථාවලදී බයාදු ලෙස සිය ගෝලයන් අතින්ද පරාජයට පත් විය.

ඕ නමි තමාගේ මෙම මානසික තත්වයෙන් මිදීමට සෙන් ගුරුවරයෙකුගේ උපකාර පැතීමට ඉටා ගත්තේය. හකුජු නම් වු තැනින් තැන ඇවිද යන සෙන් ගුරුවරයෙකු ඒ අසල කුඩා පන්සලක නවාතැන් ගෙන සිටින බව දැන ගැනීමට ලැබුනෙන් ඕනමි එහි ගොස් ඔහු මුණ ගැසී තමාගේ ගැටළුව කිවේය.

සෙන් ගුරුවරයා මෙසේ පිළිතුරු දුන්නේය. ඔබේ නම මහා රැළි නේද? හොඳයි. ඔබ අද රෑ මේ පන්සලේ නවතින්න. ඉතා ඉහළට නගින සාගර තරංගයක් සිතේ මවාගෙන ඒ ඔබ යයි සිතා ගන්න. ඔබ තව දුරටත් බියගුළු මල්ලව පොර ශූරයෙකු නොවෙයි. තමන් ඉදිරීයේ මුණ ගැසෙන සෑම දෙයක්ම අතුගා දමන, සෑම දෙයක්ම ගිල දමන මහා ජල කඳක්. මෙසේ දිගටම සිතන්න. ඔබ මේ රටේ සිටින හොඳම මල්ලව පොර ශූරයා වේවි.

එසේ කියා ගුරුතුමා එතැනින් පිටවුණි. ඕ නමි භාවනානුයෝගීව වාඩි වී තමන් මුහුදු රළක් යයි සිතන්නට උත්සාහ ගත්තේය. මුලින් ඔහුගේ සිතට බොහෝ දේ ගලා ආවේය. පසුව ඔහුට ක්‍රම ක්‍රමයෙන් මුහුදු රළ රැළි වල ස්වභාවය දැනෙන්නට පටන් ගති. රාත්‍රිය ගැඹුරු වෙද්දී රළ ද ක්‍රම ක්‍රමයෙන් විශාල විය. මල් බඳුන් වල තිබු මල් ජලයට ගසා ගෙන ගියේය. ආරාමයේ වු බුදු පිළිමයද ජලයෙන් යට වුණි. අළුයමට පෙර යාමය වෙද්දී පන්සල මැකී ගොස් රැ ළි නගින බසින මහා සාගරයක් පමණක් දක්නට ලැබුණි.

උදෑසන එහි පැමිණි ගුරුතුමාට මන්දස්මිතයක් මුවග රඳවාගෙන භාවනාවෙහි ගැලී සිටින ඕ නමි දකින්නට ලැබුණි. ඔහු හෙමිහිට මල්ලව පොර ශූරයාගේ උරහිසට තට්ටු කලේය. මින් පසු කිසිම දෙයකින් ඔබ කැළඹීමට පත් වන්නේ නැහැ. ඔබ තමයි ඒ මහා රළ. ඔබ ඉදිරීයට එන ඕනෑම දෙයක් අතුගා දමන්නට ඔබට පුළුවනි.

එදිනම මල්ලව පොරයකට බට ඕ නමි එය පහසුවෙන්ම ජය ගත්තේය. ඉන් පසුව ජපානයේ කිසි-වෙකුට ඔහුව පැරැ ද්දවීමට නොහැකි විය.

පරිවර්තනය

**ශ්‍රියා කුමාරසිංහ**

19 වන පටෙන්




''මන්දා..''

''උඹට මූනට නොකිව්වට හුඟක් අය උඹල දෙන්න ගැන කතා කරලා තියෙනවා.. මිනිස්සු දිලීපට කැමති නැහැ.. එයාගෙ ඔලුව ඉදිමිච්ච හැසිරීමට කවුරුත් කැමති නැහැ.. අපි දැනගෙන හිටියා උඹ අපිට ආශ්‍රය කරනවටවත් එයා කැමැත්තෙන් නොහිටිය බව.. මහ පොළොවෙ පය ගහලා ඉන්න දන්නෙ නැති මිනිහෙකුට උඹ වගේ ගෑනියෙක් ගැලපෙන්නෙ නැහැ කියලා අපි දැනගෙන උන්නා.. ''

''දිලීපට දොස් කියන්න එපා.. මට එයාට වෛර කරන්න බැහැ.. මට එයාව වෙනස් කරගන්න කවදාවත් බැරිවුණා.. එච්චරයි.. එයාව වෙනස් කරගන්න ඕනෙ කියලා මම තේරුම් අරන් හිටියා තමයි.. ඒත් මං ඒ තරම් ශක්තිමත් වුණේ නැහැ උදාරි.. එහෙමත් නැත්නම් එයාගෙ ශක්තිය ඉදිරියේ මං අසරණ වෙලා හිටියා වෙන්නත් පුලුවන්''

''අපි තේරුම් අරගෙන හිටියෙ උඹ මහා අසරණ සතෙක් විදිහට ඒ මනුස්සයට යට වෙලා උන්න හැටි.. මං නම් හීනෙකින් වත් හිතුවෙ නෑ ඒ අසරණ කෙල්ල මේ තරම් තද පියවරක් ගනියි කියලා ''

''කිසිම දෙයක් හිතා මතා කළේ නැහැ උදාරි.. හැම දේම නොහිතූ විදිහට ඉබේම සිදු වුණා.. හිතන්නවත් කාලයක් තිබුණෙ නැහැ.. ඒ තරම් ඉක්මණින් හැම දේම සිදු වුණා..''

''ඒක කවදා හරි විය යුතුව තියෙන්න ඇති..''

''ඔව්.. කොහේ හරි තැනක මේ සියල්ල මේ විදිහට විය යුතුය කියලා ලියවිලා තිබුණා.. කො-හේ හරි තැනක..''

ළබන කළාපයට

W.L. PARKER AND ASSOCIATES PTY. LTD
Registered Tax Agent & Accounting, Business & taxation Services
14 DAY TAX REFUNDS
INDIVIDUAL RETURNS
$60
ON SITE CONSULTATION AVAILABLE
CONTACT KASUN GAMLATH
0430138283
Email: kasun@wlparker.com.au
**************

සන්නස
අන්තර්ජාලයෙන්
www.sannasa.net

එන්න අපිට හිනා වෙන්න...
අපි අපිටම හිනා වෙන්න.......
ත්‍රිවිධ
THRIVIDHA
2007 ඔක්තෝබර් 06
සවස 3.00 ට සහ 6.30 ට
KEL WATSON THEATRE හිදී
කේසි ලංකා කලා කවයේ ඉදිරිපත් කිරීමක්